KIDS GOD WORSHIP
www.kidworship.kr

# යෝනා

## - 30th Story-


220Page

**පොතේ ගුරා** බොහෝ කාලයකට පෙර ඉශ්රායෙල් හි යෝනා නම් මිනිසෙක් ජීවත් වුණා. ඔහු දෙවියන්වහන්සේගේ වචනය දේශනා කරන්නෙකි.
එක දවසක් දෙවියන්වහන්සේ යෝනා වෙතට ඇවිත් කතා කළා.

**දෙවියන්වහන්සේ** යෝනා... නිනිවය නම් මහත් නගරයේ නපුරුකම්, දුෂ්ටකම් මා ඉදිරියට පැමිණ තිබේ. එබැවින් නුඹ ගොස් ඊට විරුද්ධව දේශනා කරන්න.

**පොතේ ගුරා** නිනිවය අති විශාල නගරයක්. එය ධනවතුන්ගෙන් සපිරි ශක්තිමත් නගරයක්. නමුත් නිනිවයේ ජනතාව ඔවුන්ගේ අසල්වාසීන්ට ප්‍රේම කළේ නෑ.
ඔවුන් කැමති වුණේ, ඔවුන් වෙනුවෙන්ම ජීවත් වෙන්නට පමණයි.
ඒ නිසා යෝනා දෙවියන්වහන්සේගේ අණට කීකරු වෙන්න කැමති වුණේ නෑ.

**යෝනා** ඒ නගරය දුෂ්ටයන්ගෙන් පිරිලා. ඔවුන් දුක් විඳලාම මැරුණාදෙන්.
මම ගිහින් දේශනා කරන්න ඕනේ නෑ. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ කැමැත්ත හැටියට ඔවුන්ට දඬුවම් කරන්න ඕන.

..........................................................................................


221Page


**පොතේ ගුරා** යෝනා දේව මගපෙන්වීම් ප්‍රතික්ෂේප කරමින් තර්ෂිෂ්ට යන නැවක් ගෙන නිනිවයට නොයා තර්ෂිෂිට යන්නට නැව් නැංගා.
මෙසේ යමින් සිටියදී හදිසියේම තද කුණාටුවක් පැමිණුනා.

**ජනතාව** අහ්හ්හ්... අහ්හ්හ්.. උදව් කරන්න... දෙවියනේ අපව බේරගන්න.
අප සමග කෝපවූයේ මොන කාරණාවටද දෙවියනි...
දෙවියන් කෝප වෙන්න හේතුව මොකක්ද ? අපි මේක හොයමු.

**පොතේ ගුරා** මේ කාරණාවට හේතු වූ පුද්ගලයා සොයාගන්න පිණිස දාදු විසිකිරීමට මේ ජනතාව තීරණයකට එළැඹුණා.
එවිට ඒ දාදුව වැටුණේ යෝනාගේ නමටයි.


**යෝනා** ඔහ්... ඇත්ත. මේ කුණාටුව අප වෙතට එවලා තියෙන්නෙ"මම සේවය කරන දෙවියන්වහන්සේ තමයි.
මා අරන් මුහුදට විසි කරන්න. එවිට මුහුද නිශ්චල වෙනු ඇත.

..........................................................................................


222Page

**පොතේ ගුරා** මිනිසුන්, යෝනාව මුහුදට විසිකළා. එකපාරටම කුණාටුව නතර වුණා.
නිශ්චලතාවයක් ආවා. සුළඟ නතර වුණා.
එකපාරටම විශාල මත්ස්‍යයෙකු පැමිණ යෝනාව ගිලගත්තා.
මේ මත්ස්‍යයාට ඒමට අණ කළේ දෙවියන්වහන්සේ ය.
යෝනා මත්ස්‍යයාගේ බඩේ දවල් 4 ක්, රෑ 3 ක් ගත කළා.

..........................................................................................


223Page

**යෝනා** ස්වාමීනි... මම පව් කළා. මම පව්කාරයෙක්.
කරුණාකර මට සමාව දී මාව ගළවාගන්න.



224Page

**පොතේ ගුරා** — දෙවියන්වහන්සේ යෝනාගේ යාච්ඥාව ඇසුවා. 4 වෙනි දවසේදී මත්ස්‍යා ඇවිත් යෝනාව ගොඩබිමට වැමෑරුවා. යෝනා මත්ස්‍යයාගේ බඩින් පිටතට ආ ගමන් දෙවියන්වහන්සේ මුලින් අණ කළ පරිදි නිනිවයට ගොස් දේව පණිවිඩය දේශනා කළා.

**යෝනා** — සියලු දෙනා අසන්න. දින 40 කින් දෙවියන්වහන්සේ නිනිවය නගරය විනාශ කරන්න යනවා.

**පොතේ ගුරා** — යෝනා දෙවියන්වහන්සේගේ වචනය කියමින්, නගරය ඇතුලේ ඇවිදගෙන ගියා. මේ නගරයේ මිනිසුන් යෝනාට සවන්දුන් පසුව බය වී නිරාහාරයෙන් යාච්ඥා කරමින් දෙවියන්වහන්සේට කතා කළා.

**ජනතාව** — ස්වාමීනි කරුණා කරන්න. අපේ නගරය විනාශ කරන්න එපා. අපේ පව් වලට අපට සමාව දෙන්න. අපිට කරුණාව දෙන්න.

**පොතේ ගුරා** — දෙවියන්වහන්සේ, ඔවුන්ගේ පසුතැවිල්ලෙන් පිරි හදවත දුටුවා.
ඔවුන්ට දඬුවම් නොකරන්නත් තීරණය කළා.
ඒ නිසා නිනිවය දේශයත් එහි ජනතාවත් එදා මිදීම ලැබුවා.
දේව උදහසින් ඉවත් වුණා.....

..........................................................................................

**ජිවිතයට අදාල කිරීම** — දුවේ පුතේ .... අකීකරුකම කියන්නේ මොකක්ද?
දෙවියන්වහන්සේ කියන දේ නොකිරීමයි. දෙමව්පියන් ගුරුවරුන් කියන දේ නොකිරීමයි. අවවාද ගණන් නොගැනීමයි.
අකීකරු වුණාම කරදර ගොඩායි. යෝනා වගේ අපිත් අපි අකීකරු වුණ දේවල් ගැන දෙවියන්වහන්සේගෙන් සමාව ගමු නේද ?
ඊවගේම අම්මාටත් තාත්තාටත් ගිහින් කියන්න මට සමාවෙන්න කියලා.
දැන් දෙවියන්වහන්සේ අපි ගැන සතුටු වෙයි.
අද පටන් අපි දෙවියන්වහන්සේට වගේම දෙමව්පියන්ටත් ගුරුවරුන්ටත් කීකරු වෙමු.